බන්ධනාගාර මූලස්ථානය
சிறைச்சாலைத் தலைமையகம்
PRISON HEADQUARTERS
150, බේස්ලයින් පාර, කොළඹ 09. 150, பேஸ்லைன் வீதி,கொழும்பு 09. 150, Baseline Road, Colombo-09.

| දුරකථන தொலைபேசி Telephones | කාර්යාලය அலுவலகம் Office | 2695204 4677177 | කොමසාරිස් ජනරාල් ஆணையாளர் நாயகம் Commissioner - General | 2691976 | කොමසාරිස් ஆணையாளர் Commissioner | 2695221 2692818 | ෆැක්ස් பெக்ஸ் Fax | 2695206 4677180 |
|---|---|---|---|---|---|---|---|---|

| මගේ අංකය எனது இல. My No | ඩී16/විභාග/විවෘත/2019 | ඔබේ අංකය உமது இல. Your No | | දිනය திகதி Date | 2021.08.25 |
|---|---|---|---|---|---|

බන්ධනාගාර නියාමක තනතුරට බඳවා ගැනීම (2019)
සඳහා වන ගිවිසුම් අත්සන් කිරීම සහ ප්‍රායෝගික පුහුණුව සඳහා යොමු කර ඇති
සියළු අයදුම්කරුවන්ගේ අවධානයට,

**<u>බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ, බන්ධනාගාර නියාමක තනතුරට බඳවා ගැනීම (2019) සඳහා වන ගිවිසුම් අත්සන් කිරීම සහ ප්‍රායෝගික පුහුණුව සඳහා යොමු කිරීම.</u>**

මගේ සමාංක හා 2021.08.20 දිනැති ලිපියට අදාලවයි.

02. පවතින කොවිඩ් 19 වසංගත තත්වය මත පනවා ඇති සංවරණ සීමා හේතුවෙන් සහ නිසි සෞඛ්‍ය මාර්ගෝපදේශයන් යටතේ කටයුතු කල යුතුව ඇති බැවින් රැස්වන පිරිස අවම කිරීමේ අරමුණින්, ඔබ අත්සන් කිරීමට නියමිත සේවා ගිවිසුම මෙහි අමුණා ඇති අතර, ඔබ විසින් එය හොඳින් කියවා එහි පිටපත් 02 ක් මුද්‍රණය කර ඔබ සහ ඔබගේ සාක්ෂිකරුවන් දෙදෙනාගේ (සාක්ෂි 1 සහ සාක්ෂි 2) තොරතුරු සම්පූර්ණ කර ඔවුන් විසින් අත්සන් තබා 2021.09.06 දින රැගෙන ඒමට කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

03. ඒ අනුව, 2021.09.06 දින සාක්ෂිකරුවන් දෙදෙනා රැගෙන ඒමට අවශ්‍ය නොවන අතර, සාක්ෂිකරුවන්ගේ ජාතික හැඳුනුම්පත් පිටපත්, සේවා හැඳුනුම්පත් පිටපත්, සේවය සනාථ කිරීමේ ලිපිය සහ සේවය සනාථ කිරීම සඳහා සාමදාන විනිශ්වයකාරවරයෙකුගෙන් ලබා ගත් දිවුරුම් ප්‍රකාශයක් ගිවිසුම සමඟ අමුණා රැගෙන ඒමට කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

04. තවද, සියළුම ආධුනික පිරිමි නිලධාරීන් ප්‍රායෝගික පුහුණුව සඳහා පැමිණීමේදී තම කොණ්ඩය ඉතා කොටට (නොම්බර 01) කපා පැමිණිය යුතු බව තවදුරටත් දන්වා සිටිමි.

[signature]

වන්දන ඒකනායක
බන්ධනාගාර කොමසාරිස් (පාලන)
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට

Scanned with CamScanner

## ගිවිසුම් ප්‍රකාශය.

එක් පාර්ශවයකට…………..........…...................………..................................…………..........…………………….…...…....ලිපිනයෙහි පදිංචි, ............................................................................................................................................... (...............................................) ද, (මෙහි මින් මතු නිලධාරියා වශයෙන් හැඳින්වෙන) අනෙක් පාර්ශවයට බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙනුවෙන් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් ද, යන දෙපාර්ශවය විසින් මෙහි මින්මතු සඳහන් කෙරෙන දිනයන්හි සකසා එළැඹුණු ගිවිසුමයි.

ඔබ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ බන්ධනාගාර නියාමක තනතුරට පත් කිරීම සඳහා තෝරාගනු ලැබ ඇති අතර, නිලධාරියා පුහුණුව සඳහා ඇතුළු වූ දින සිට තෙමසකට ආසන්න කාලයක් පුහුණු පාඨමාලාවක් හදාරා මෙහි මින්මතු අඩංගු කෙරෙන නියමයන් මත ප්‍රතිඥා සහ කොන්දේසි වලට යටත්ව පුහුණුව නිම කළ යුතු හෙයින්ද, බන්ධනාගාර දෙපාර්තමේන්තුව යථෝක්ත කාර්යය සඳහා පුහුණු තෙමසකට ආසන්න කාලයක් සඳහා වැටුප් හා දීමනා ලබාදීමට එකඟ වී ඇති හෙයින් ද, නිලධාරියාට යථෝක්ත පුහුණු පාඨමාලාව පිළිගැනීමට විධානය කෙරුණු විට යථෝක්ත පුහුණුවට ගොස් මෙහි මින්මතු අඩංගු කෙරෙන නියමයන් මත ප්‍රතිඥා හා කොන්දේසි වලට යටත්ව තෙමසකට ආසන්න කාලයක් තුල යථෝක්ත පුහුණුව ලබාගැනීමටත් එකඟ වී ඇති හෙයින්ද, පහත දැක්වෙන පරිදි මෙයින් එකඟත්වයට පැමිණියෙමි.

01. බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් විධාන කෙරුණු විට නිලධාරියා යථෝක්ත ආයතනයට පුහුණුවට යා යුතු අතර, බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් ඔහු වෙනුවෙන් සංවිධානය කෙරුණු පාඨමාලාව සඳහා ඔහු යථෝක්ත ආයතනයට ඇතුළු වූ දින සිට තෙමසකට ආසන්න කාලයක් තුළ ඔහු විසින් අනලස්ව හා හිතෛෂීව හදාරා ඔහු වෙනුවෙන් නියමිත පාඨමාලාව නිම කළ යුතුය.

02. කවර අවස්ථාවක වුව ද,මේ ගිවිසුම පහත දැක්වෙන හේතුන් මත පරිච්ඡින්න කිරීමේ පූර්ණ අයිතිය බන්ධනාගාර කොමසාරිස් ජනරාල් සතුවේ.
   (අ). නිලධාරියාගේ නොසැළැකිලිමත්කම.
   (ආ). රාජකාරිය ඉටු කිරීමට නැතහොත් තමා වෙනුවෙන් නිශ්චිත පුහුණුව අනලස්ව හැදෑරීමට ඔහු අපොහොසත්වීම.
   (ඇ). පුහුණු කාල පරිච්ඡේදය තුල ඔහු අකීකරු වීම නැතහොත් විෂමාචාර ක්‍රියාවක යෙදීම.
   (ඈ). වැඩිදුර පුහුණුව සඳහා අයෝග්‍ය හෝ නුසුදුසු තත්වයකට පත් කරන්නාවූ රෝගයකින් ඔහු පෙළෙන බව වෛද්‍ය නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලැබ තිබීම.
   (ඉ). ඔහු පුහුණුව සඳහා නුසුදුසු බව හෝ අයෝග්‍ය බව හෝ එකී ආයතනයේ පරිපාලන ප්‍රධානියා වාර්තා කළ විට මෙහි “ඈ” උපඡේදයෙහි දැක්වෙන පරිදි අසනීප නිසා පරිච්ඡින්න කිරීම හැර පූර්වෝක්ත පරිදි පරිච්ඡින්න කෙරුණු විට නිලධාරියා මෙයින් තමාට ලැබෙන වරප්‍රසාද හෝ ප්‍රතිලාභ හෝ කිසිවකටත් කිසිදු වන්දියකටත්, හිමිකම් නොලබන අතර පුහුණුව සඳහා වැයවුණු මුදල් සියල්ල බන්ධනාගාර දෙපාර්තමේන්තුවට ආපසු ගෙවිය යුතුය.

03. නිලධාරියා ගිවිසුම් අත්සන් තබන දින සිට ස්වේච්ඡාවෙන් එකී පුහුණු පාඨමාලාව අවසන් කළහොත් හෝ අතහැර දැමුවහොත් කවර ආකාරයක හෝ විෂමාචාරයකින් පුහුණු පාඨමාලාවෙන් ඉවත් කළහොත් හෝ පුහුණු කිරීමේ සියළු වියදම් බන්ධනාගාර දෙපාර්තමේන්තුවට ආපසු ගෙවීමට ඔහු එකඟ වන අතර, පූර්වෝක්ත පරිදි එලෙස අවසන් කිරීමේ දින සිට සිය නඩත්තුව සඳහා වගකිව යුතුවේ.

04. නිලධාරියා විසින් එකී පුහුණු කාලය අවසානයේ පුහුණුව නිම කිරීමෙන් පසු බන්ධනාගාර දෙපාර්තමේන්තුව අන් අයුරකින් විධානය කරනු ලැබුවහොත් විනා අවශ්‍ය වුවහොත් බන්ධනාගාර දෙපාර්තමේන්තුව යථෝක්ත පරිදි තම පත්වීමේ දින සිට දස (10) වසරකට නොඅඩු කාලයක් සේවය කළ යුතු අතර, ඒ මුළු කාල සීමාව තුල සියලුම ක්‍රියා සහ රාජකාරි අනලස්ව හා කාර්යක්ෂමවත් ඉටුකළ යුතු අතර, එකී දසවස් කාලය අවසන් වීමට පෙර බන්ධනාගාර දෙපාර්තමේන්තුව ප්‍රකාශිත අවසරය ඇතුව විනා ඒ සේවා අත්නොහළ යුතුය.

05. නිලධාරියා විසින් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටියදී සේවකයෙකු වශයෙන් නිල රාජකාරි වෙනුවෙන් විශේෂයෙන්ම කැපවිය යුතු අතර, ගාස්තුවක් හෝ සැළකිල්ලක් හෝ අපේක්ෂාවෙන් කිසිවෙකු හට කිසිඳු වෘත්තීය සේවයක් නොසැපයිය යුතුය.

06. පුහුණුව සතුටුදායක ලෙස නිම කිරීමට නිලධාරියා අපොහොසත් වුවහොත් හෝ සතුටුදායක ලෙස පුහුණුව නිම කිරීමෙන් පසු බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සේවයෙහි රාජකාරි යලි භාරගැනීමෙන් පසු පත් වීමේ දින සිට දස (10) වසරකට නොඅඩු කාලයක් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සේවය කිරීම ප්‍රතික්ෂේප කළහොත් හෝ එසේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් හෝ එකී දසවස් කාලය තුල එලෙස නොකඩවා සේවය කිරීමට සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු ලෙස තමාගෙන් අවශ්‍ය විය හැකි සියලු කාර්යයන් සහ රාජකාරි අනලස්ව සහ කාර්යක්ෂමවත්ව ඉටු කිරීමට අපොහොසත් වුවහොත් බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙන් එකී දස වස (10) අවසන් වීමට පෙර ඉල්ලා අස්වීමෙන්, සේවයෙන් පහකරනු ලැබීමෙන් හෝ අන් අයුරකින් හෝ ඒ සේවයෙන් ඉවත් වුවහොත් නිලධාරියා විසින් පුහුණුව සඳහා දරන ලද සියලු වියදම් බන්ධනාගාර දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුය.

07. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් හෝ ඔහු වෙනුවෙන් හෝ සහතික කරන ගිණුම් ප්‍රකාශයන් ඉහත දැක්වෙන 2, 3 සහ 6 වැනි වගන්ති යටතේ බන්ධනාගාර දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුදල් සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු අතර, එය කවර උසාවියකට හෝ ඉදිරිපත් කළ සැනින් එහි අඩංගු කරුණු හෝ අත්සන හෝ වෙනුවෙන් වෙනත් සාක්ෂි නොමැතිව ද ඒ මුදල වෙනුවෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් ලෙස පිළිගත යුතු බව ගිවිස ගනු ලැබේ.

08. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් හෝ ඔහු වෙනුවෙන් නිකුත් කෙරෙන සහතිකයක් ඉහත 2, 3, 4 සහ 7 වැනි වගන්තිවල දැක්වෙන කවර හෝ කරුණක් සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් ලෙස ඕනෑම උසාවියක පිළිගත යුතුයැයි ගිවිස ගනු ලබන අතර, එය ඕනෑම උසාවියකට ඉදිරිපත් කළ විගස එහි අඩංගු කරුණු හෝ අත්සන සම්බන්ධයෙන් වෙනත් සාක්ෂි නොමැතිව ද එහි අඩංගු කරුණු වෙනුවෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් වශයෙන් පිළිගත යුතු යයි ගිවිස ගනු ලැබේ.

09. නිලධාරියා මීට පෙර කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී නොමැති බවත්, ඔහු හට විරුද්ධව කිසිදු උසාවියක විසඳීමට නඩු හෝ පොලීසියක පැමිණිලි නොමැති බවත් සහතික කර ලබා ගනු ලබන පොලිස් නිශ්කාශන වාර්ථා, බුද්ධි වාර්ථා මඟින් හෝ අධ්‍යාපන සුදුසුකම් නොමැතිවීම්, ශාරීරික දුබලතා, ශාරීරික වෙනස්කම් (පච්ච වැනි) සිදු කර තිබීම වැනි හේතූන් මත ඔහු තනතුරට නුසුදුසු බව තෝරා ගැනීමට පෙර හෝ පත්වීම ලබා දීමෙන් පසු අනාවරණය වුවහොත් එම පත්වීම් ලැබීමට නුසුදුස්සෙකු වන බැවින් ඔබගේ පත්වීම අවලංගු කරනු ලැබේ.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල් යනුවෙන් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් ධුරය දරන්නාවූ ඒ ධුරයෙහි වැඩ බලන්නා වූ හෝ නිලධාරියා නැතහොත් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් දැනට ක්‍රියාත්මක කරන්නා වූ කාර්යයන් තාවකාලිකව ඉටුකරන්නා වූ නිලධාරියා අදහස් කෙරේ.

පුහුණුව සඳහා දරණ ලද වියදම් යනුවෙන් අදහස් කරනු ලබන්නේ පුහුණු කාලය තුල නිලධාරියාට ගෙවනු ලබන වැටුප් දීමනා සහ පුහුණුවට වැය වූ සියලු මුදල්ය.

මීට සාක්ෂි වශයෙන් එකී දෙපාර්ශවය විසින් පහත සඳහන් දිනයන්හිදී සහ ස්ථාන වලදී තම තමන්ගේ අත්සන මෙහි තබන ලදී.

එකී අය විසින් වර්ෂ දෙදහස් විසිඑකක් ක් වූ සැප්තැම්බර් මස .................. වන ................................. දින අත්සන් තබන ලදී.

(..............................) ..........................................

ජාතික හැඳුනුම්පත් අංකය — නිලධාරියාගේ අත්සන

**<u>සාක්ෂි 1:</u>**

**නම** :-...........................................................................................

**ලිපිනය** :-...........................................................................................

**තනතුර** :-...................................................... **ජාතික හැඳුනුම්පත් අංකය :-** ..............................................

**රාජකාරි ලිපිනය:-** ...........................................................................................

**අත්සන** :-........................................................................................

**<u>සාක්ෂි 2:</u>**

**නම** :-...........................................................................................

**ලිපිනය** :-...........................................................................................

**තනතුර** :-...................................................... **ජාතික හැඳුනුම්පත් අංකය :-** ..............................................

**රාජකාරි ලිපිනය:-** ...........................................................................................

**අත්සන** :-........................................................................................

බන්ධනාගාර අධිකාරී **-** ........................... විසින් බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙනුවෙන් වර්ෂ දෙදහස් විසිඑකක් වූ සැප්තැම්බර් මස .................. වැනි ............................ දින ................................................................බන්ධනාගාරයේදී/ ආයතනයේදී / මධ්‍යස්ථානයේ දී අත්සන් තබන ලදී.

**<u>සාක්ෂි</u>**

**නම** **:-** ......................................................................................

**ලිපිනය** **:-** ......................................................................................

**තනතුර** **:-** බන්ධනාගාර අධිකාරී **-** ........................... .....................................................

**ජාතික හැඳුනුම්පත් අංකය** **:-** ................................. බන්ධනාගාර අධිකාරී **-** ....................

......................................................

බන්ධනාගාර කොමසාරිස් (පාලන)

......................................................

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්